**ශීර්ෂය 143 - පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

-----------------------------------------------------------

## 1.1 විගණන විෂය පථය

----------------------

පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජූලි 31 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

-----------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණ

----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**(ආ) විසර්ජන ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 425,000,000 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 422,824,244 ක්උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 2,175,756 ක් හෙවත් සියයට 0.51 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 373,000,000 | 372,884,684 | 115,316 | 0.03 |
| මූලධන | 52,000,000 | 49,939,560 | 2,060,440 | 3.96 |
| එකතුව | 425,000,000 | 422,824,244 | 2,175,756 | 0.51 |

**(ii) අයවැය විචලනය**

වැය විෂයයන් 4 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 සිට සියයට 55 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **විෂය අංකය** | **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|---|
| | **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 14301 | 6,000,000 | 2,938,460 | 2,000,000 | 3,690,538 | 21,500,000 | 8,324,796 |

**(ඇ) අග්‍රිම ගිණුම්**

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු. 662,322 ක් විය.

**(ඉ) පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු. 1,237,884 ක් විය.

**1.4 වත්කම් කළමනාකරණය**

**බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.13,605,454 ක් වූ අතර, ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි වර්ෂ 03 ට අඩු | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| රු. | රු. | රු. |
| 10,343,228 | 3,262,226 | 13,605,454 |

## 1.5 අනුකූල නොවීම්

--------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>----------------------------------<br>මුදල් රෙගුලාසි 1646 | අමාත්‍යාංශය සතු සංචිත වාහනයකට අදාල දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ<br>--------------------------------<br>2010 මැයි 14 දිනැති අංක සීඑස්/17/1 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | ගරු ඇමතිවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු සඳහා වෙන්කළ හැකි උපරිම නිල වාහන සංඛ්‍යාව 3 ක් වුවද එයට අනුකූල නොවන පරිදි ඇමතිතුමිය වෙනුවෙන් වාහන 4 ක් වෙන් කර තිබුණි. |

## 1.6 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 06 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 38 | 30 | 08 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 20 | 17 | 03 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | - | - |
| | එකතුව | 69 | 54 | 15 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩු 15 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.